# ළමා ශ්‍රමය හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ නෛතික තත්වය ප්‍රමාණවත්ද?

එරංගා දිසානායක*

## හැඳින්වීම

ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අනුව වයස අවුරුදු 18 ට අඩු සෑම පුද්ගලයෙක්ම “ළමයා” යන තත්වය යටතේ හඳුනාගනී. එවන් අයෙකුට අත්‍යන්තයෙන්ම හිමිවිය යුතු ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කොට තහවුරු කරදීම රාජ්‍යන්ගේ වගකීම බව සම්මුතිය තවදුරටත් දක්වයි. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 23වන ව්‍යවස්ථාව යටතේ සියලු දෙනාට තමා කැමති වෘත්තියක නියුක්ත වීමට අයිතිය ලබාදී තිබේ. ශ්‍රීලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(උ) වගන්තිය ඔස්සේද එය මූලික අයිතියක් ලෙස හඳුනාගනී. එසේ වුවත් ළමයෙකුගේ අධ්‍යාපන හා වෙනත් අයිතීන් බණ්ඩනය වන පරිදි ඔවුන් සේවයේ නියුක්ත කිරීම නීතියෙන් තහනම් කර තිබේ.

ළමා ශ්‍රමය, ළමයින් අපයෝජනයේ හා සූරා කෑමේ වඩාත් භයානකම පැතිකඩ වේ. ළමා ශ්‍රමිකයන් බිහි වීමට මූලිකම හේතුව දැඩි ආර්ථික ගැටළු වලට මුහුණ දීමට සිදු වීම බව පැහැදිලිව පෙනෙන කරුණකි. ඒ අනුව ළමයින් තම පවුලේ ආර්ථිකයට ශක්තියක් වීම සඳහා පවුලේම ව්‍යාපාර හෝ කෘෂිකර්මාන්ත වල නියැලීම, කුඩා පරිමාණ කර්මාන්ත වල හෝගෘහ සේවයේ නිරත වීම බහුලය. වතු හා නාගරික මුඩුක්කු ආශ්‍රිත දරුවන් අඩු වයසින් රැකියා වල නිරත වීමේ වැඩි ප්‍රවණතාවයක්ද දක්නට ලැබෙන බව සමීක්ෂණ හඳුනා ගෙන තිබේ. අන්තර්ජාතික කම්කරු සංවිධානයට අනුව ආසියාව, අප්‍රිකාව ඇතුළුව දියුණු වෙමින් පවතින බොහොමයක් රාජ්‍යයන්වල අවුරුදු 5 ත්14 අතර ළමයින් මිලියන 250කට ආසන්න පිරිසක් මෙම තත්වයට ගොදුරුවේ. (Ekanayake,2018) මෙලෙස අවිධිමත් හා නීත්‍යානුකූල නොවන පරිදි රැකියා ක්ෂේත්‍ර තුළ ළමා ශ්‍රමිකයින් සේවයේ යොදවා ගැනීම හරහා ළමයෙකු යන තත්වය යටතේ හිමි වන සියලු අයිතිවාසිකම් බණ්ඩනය වන බව පැහැදිලිවම පෙනේ. එයට පිළියමක් ලෙස අන්තර්ජාතික කම්කරු සංවිධානය විසින් විවිධ සම්මුතීන් හරහා නෛතික ප්‍රතිපාදන ස්ථාපිත කර තිබේ. ඒවායේ මූලික පරමාර්ථය, විවිධ වෘත්තීන් අර්ථ නිරූපණය කිරීම හා ස්වභාවය හඳුනා ගැනීම, ඒවාට අවම වයස ආදී විශේෂතත්ත්ව හඳුන්වාදීම හාවලදායී යාන්ත්‍රණයකට නිර්දේශ ඉදිරිපත් කිරීමයි.

එම සම්මුතිතුළ අන්තර්ගත මූලික ප්‍රමිතීන් විශ්වීය වන අතර ඒවා මානව හිමිකම් සමග සහසම්බන්ධ වන ලෙස තහවුරු කර තිබේ. (Sarvesvaran,2010)ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 32 වන ව්‍යවස්ථාවයටතේ අන්තරාදායක ආකාරයේ වෘත්තීන්හි නිරත වීම හරහා දරුවන්ට සිදුවන ආපදාවන්ගෙන් ආරක්ෂා වීමට අයිතියක් ඇති බව හඳුනා ගෙන ඇති අතර ළමයින්ගේ අධ්‍යාපනයවළක්වන හෝ ශාරීරික, මානසික, ආධ්‍යාත්මික, සදාචාරාත්මක හා සමාජීය සංවර්ධනය වළක්වාලන වෘත්තීන්හි නියැලීම තහනම් කර තිබේ. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 25 වගන්තියට අනුව දරුවන් විශේෂ ආරක්ෂාවක් හා මගපෙන්වීමක් යටතේ සිටිය යුතු අතර ළමා ශ්‍රමිකයෙකු වීම හරහා එකී අයිතිය මෙන්ම එම ප්‍රකාශනයේ 26 වනව්‍යවස්ථාවේ දක්වා ඇති අධ්‍යාපනයට ඇති අයිතියද එමගින් බණ්ඩනයවේ. ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 10(3) ව්‍යවස්ථාව ප්‍රකාරව ළමා ශ්‍රමය නීතියෙන් තහනම් කර තිබෙන අතර නීතියේ සීමාවන්ට අනුව ළමා ශ්‍රමිකයින් සඳහා නිසි ප්‍රතිපත්ති සම්පාදනයට රාජ්‍යයන්ට වගකීමක් පවතී. සිවිල් හා

* අවසන් වසර, නීති පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 8වන ව්‍යවස්ථාව හරහා වහල්භාවය, බලහත්කාර සේවය තහනම්කර තිබෙන අතර මේ යටතේ ළමා ශ්‍රමිකයින්ද අදාළ කරගත හැකිවේ.

## ළමා ශ්‍රමය හා ළමා අයිතීන් බණ්ඩනය

2016,ළමාක්‍රියාකාරකම්පිළිබඳ සමීක්ෂණ වාර්තා අනුව 5 – 17 අතර ළමයින්ගෙන්2.3%ක් කුමන හෝ ආර්ථික කටයුත්තක නියැලෙන බව පෙනේ. එමෙන්ම ලංකාවේ ළමා ශ්‍රමය විධිමත් හා අවිධිමත් යන ක්ෂේත්‍ර ද්විත්වයම ඔස්සේ හඳුනාගතහැක. රාජ්‍ය අංශයේත් පෞද්ගලික අංශයේ පිළිගත් ආයතන වලත් මෙය නැති තරමය. නමුත් දියුණු වෙමින් පවතින රාජ්‍යයක් ලෙස ලංකාවේ ළමා ශ්‍රමය ඉතා අවිධිමත් ලෙස විවිධ ක්‍රමවේද ඔස්සේ භාවිත වන අවස්ථා බහුලවම හමුවේ. කෘෂිකාර්මික අංශ, ධීවර කර්මාන්තය, ගෘහ සේවය, සංචාරක මග පෙන්වන්නන් ලෙස, නිවෙස් වලට ගොස් හෝ වාහන අසලට ගොස් වෙළදාමේ යෙදීම, ගණිකා වෘත්තීය, මත්ද්‍රව්‍ය වෙළදාම වැනි නීති විරෝධී රැකියාවල දරුවන් යොදා ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම් වලදී අත් උදව් කරුවන් ලෙස යොදා ගැනීම, හිඟමන් යැදීම ආදී බොහෝමයක් තුළ ළමා ශ්‍රමය භාවිත වේ. රතිඤ්ඤා , මල් වෙඩි වැනි වෙඩි බෙහෙත් නිෂ්පාදන ආශ්‍රිතව බහුලව ළමා ශ්‍රමය යොදා ගන්නා බව සුලබ කරුණකි.

ළමා ශ්‍රමය නීති විරෝධී ලෙස යෙදවීම නිසා ළමයින්ගේ උල්ලංඝනය වන අයිතීන් විවිධාකාරයෙන් වර්ග කළ හැකි වේ. මේ හරහා කඩවන මූලිකම අයිතිය අධ්‍යාපනයට ඇති අයිතියයි.2016ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණ දත්ත වාර්තා අනුව ලංකාවේ අවුරුදු 5 – 17 ළමයින්ගෙන් 9.9% ක් පාසල් නොගොස් ආර්ථික කටයුතුවල නිරතවේ. එයින් බහුතරය වාර්තාවනුයේ නාගරික ප්‍රදේශ වලිනි. දත්ත අනුව එමප්‍රමාණය 72% කි. එයින්ද 44% ක් නුපුහුණු හා වැටුප් රහිත ළමා ශ්‍රමිකයන්වේ. ලංකාවේ මුල්කාලීනව අනිවාර්ය අධ්‍යාපනය වයස අවුරුදු 14 තෙක් සීමා විය. නමුත් පසුව එය වයස අවුරුදු 16 දක්වා දීර්ඝ කරන ලදී.(Regulation of Compulsory Education, 2016) කම්කරු නීතිය යටතේ ළමා ශ්‍රමිකයෙකු වීම වළක්වාලනු ලබන්නේ වයස අවුරුදු 14 සීමාව තෙක් පමණි. ඒ අනුව මෙම නීති තත්ත්වයන් එකිනෙකට ගැටෙන බව පෙනේ. වයස 14 ත් 16 ත් අතර පුද්ගලයන් පිළිබඳ සාකච්ඡා නොවීම කම්කරු නීතියේ හිස්තැනක් ලෙස හඳුනා ගත හැක. මෙකී අයිතීන් තුලනය කිරීම සඳහා අධ්‍යාපනයට ඇති අයිතිය සීමා කළ නොහැකි වුවත් ශ්‍රමිකයෙකු විය හැකි වයස 16 දක්වා සංශෝධනය කළ හැකි බව පෙනෙන කරුණකි. අධ්‍යාපනයට ඇති අයිතිය හැරුණුකොටළමා කාලය ගත කිරීමට ඇති අයිතිය , උසස් අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුවක් කිරීමට ඇති අයිතිය යනාදී අයිතීන් අහිමි වීම, දරුවන්ට සමාජය පිළිබඳව ඇති අඩු අවබෝධය නිසා විවිධාකාරයෙන් අපයෝජනයන්ට ලක් වීම, අනාගතයේ වැදගත් රැකියාවක නිරත වීමට ඇති අයිතිය අහිමි වීම, අන්තරාදායක අනතුරු පිළිබඳ දැනීමක් නොමැතිකම නිසා මානසික හා ශාරීරික වශයෙන් දරුවන්ට හානි වීම, ඇතැම් අවස්ථා වලදී සමාජයෙන් කොන් වීමට සිදු වීම ආදිය සිදු වේ.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය පනවා ඇති බොහෝමයක් සම්මුතීන්හි පාර්ශවකාර රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව ද්විත්ව න්‍යායවාදී රාජ්‍යක් ලෙස එම සම්මුති අපරානුමත කරතිබේ. එමනිසා සම්මුති මගින් ප්‍රවර්ධනය කර ඇති ප්‍රධාන නෛතික මූලධර්ම සහ කම්කරු අයිතිවාසිකම් තහවුරු කිරීමට වගකීමෙන් බැඳී සිටි. 1995 ජාතික ශ්‍රමිකයින් පිළිබඳ ප්‍රඥප්තියේ 7 වන අනු කොටස ප්‍රකාරව ළමයින් සේවයේ යෙදවීම වැළක්වීම සඳහා නිසි පියවර ගන්නා බවට ලංකාව එහි පාර්ශ්වකාර රාජ්‍යක් ලෙස වග වන බව දක්වා තිබේ.(Ekanayake,2018) ඒඅනුවළමා ශ්‍රමයපිටු දැකීම සඳහා බොහෝමයක් නෛතික ප්‍රතිපාදන ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ දක්නට ලැබේ. රටේ මූලිකම නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 (13) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ළමයින් හා යෞවනයන් කායික හා මානසික වශයෙන්, සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන්, සාමාජික වශයෙන් පූර්ණ වර්ධනයට

MANURAWA 2020

©All rights reserved

පත් වන බවට වග බලා ගැනීමටත් ඔවුන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් විශේෂ පරිශ්‍රමයකින් යුක්තව කටයුතු කිරීමටත් රාජ්‍යයට වගකීමක් පවතී. මෙම ප්‍රතිපාදනය ළමා ශ්‍රමිකයන් සම්බන්ධව එතරම්ම සාධනීය ප්‍රවේශයක් නොවූවත් ළමයෙක් ශ්‍රමිකයෙකු වීමෙන් අත්වන අයහපත් තත්වයන්ගෙන් මුදවා ගැනීමට රාජ්‍යයට ව්‍යංග වගකීමක් ඇති කර තිබේ.(Sarvesvaran,2010)

ඊට අමතරව අන්තර්ජාතික කම්කරු සංවිධාන සම්මුති අතරින් ළමා ශ්‍රමිකයන් සම්බන්ධව ප්‍රධාන වශයෙන් හඳුනා ගෙන තිබෙන සම්මුති දෙකටම ශ්‍රී ලංකාව පාර්ශවකාර රාජ්‍යයක් වේ. ඒඅනුව 1973 වසරේදී සම්මත වූ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ 138 සම්මුතිය හරහා ශ්‍රමිකයකු විය හැකි අවම වයස පිළිබඳව දක්වයි. 2000 වසරේදී සම්මත 182 සම්මුතිය හරහා අන්තරාදායක සේවයන් පිළිබඳව දක්වා තිබේ.

## අවමවයස්සීමාව

2000 දී ලංකාවඅපරානුමත කළ අවම වයස පිළිබඳ සම්මුතියේ ( 138සම්මුතිය) වයස අවුරුදු 15 ට අඩු කිසිවෙකු සේවයේ යෙදවීම තහනම් කර තිබේ. (Article 2.3 of Convention No.138, 1973) නමුත්මේ සඳහා ව්‍යතිරේඛයක් ලෙස ආර්ථිකවශයෙන් තවමත් ස්ථාවර නොවන හා අධ්‍යාපන පහසුකම් ප්‍රමාණවත් ලෙස සංවර්ධනය වී නොමැති රාජ්‍යයන්ටමෙමසීමාව අවුරුදු 14 දක්වාඅඩුවේ. (Article 2.4of Convention No.138, 1973) එමෙන්ම යම් වෘත්තියක් ළමයෙකුගේ සෞඛ්‍ය, ආරක්ෂාව හා සදාචාරය විනාශ කරන්නක් නම් වයස අවුරුදු 18 ට අඩු යම් කෙනෙක් ඒවායේ නිරත වීම මෙම සම්මුතියෙන් වළක්වන බව තවදුරටත් දක්වා තිබේ.(Article 3.1of Convention No.138, 1973) එමෙන්ම වයස අවුරුදු 18ට වඩා අඩු ළමයින් අවදානම්කාරී වෘත්තීන්හි යෙදීම තහනම් බව මෙම සම්මුතිය තුළ දක්වයි. නමුත් අදාළ අන්තරායන් වළක්වා ගැනීමට සම්පූර්ණ ආරක්ෂාවක් ලබා දී ඇත්නම් හෝ අන්තරායන්ගෙන් වැළකීමට මෙන්ම වෘත්තියේ නියැලීමට අදාළව නිසි උපදෙස් මාලාවක් හා වෘත්තීය පුහුණුවක් දී ඇත්නම් පමණක් එම වයස් සීමාව 16 දක්වා අඩු වේ.

කාන්තාවන්ගේ තරුණයින්ගේ හා ළමයින්ගේ සේවා නියුක්තිය පිළිබඳ පනත (13 සහ 14 වගන්ති), සාප්පු හා කාර්යාල සේවක පනත (10(1) වගන්තිය) සහ අවම වැටුප් පිළිබඳ ඉන්දියානු ශ්‍රමිකයින්ගේ ආඥා පනත (4වගන්තිය)යනාදී සියලු නෛතික ප්‍රතිපාදන තුළදවයස අවුරුදු 14ට අඩු දරුවන් සේවයේ යෙදවිය නොහැකි බව දක්වා තිබේ. කාන්තාවන්ගේ තරුණයින්ගේ හා ළමයින්ගේ සේවා නියුක්තිය පිළිබඳ පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 15 ට අඩු දරුවන් යාත්‍රා, ඔරුආශ්‍රිත සේවයේ යෙදවීම තහනම් කර තිබේ. එම පනතේම වයස අවුරුදු 18ට අඩු යම් කෙනෙක් තමාගේ ජීවිතයට අවදානමක් ඇති පොදු ක්‍රියා තුළ නිරත වීම තහනම් කර තිබේ.කර්මාන්තශාලා, සාප්පු, වතු ආශ්‍රිත රැකියා, පදික වෙළඳාම, පොදු හෝ පෞද්ගලික කාර්මික ව්‍යාපාර වල නියැලීමේ අවම වයස් සීමාව අවුරුදු 14 වේ. ධීවර ආශ්‍රිත රැකියා අවම වයස අවුරුදු 15 ට සීමා වන අතර රාත්‍රී කාලයේ රැකියා වල නියැලීම අවුරුදු 18 ට ඉහළඅයට පමණක් වලංගු වේ. ගැහැණු ළමයින් සඳහා කිසිදු අකාරයේ බර වැඩ හෝ පතල් කර්මාන්තය ආදීභූගත වැඩ වල නියැලීම තහනම් වේ.(Ekanayake,2018)

කාන්තාවන්ගේ තරුණයින්ගේ හා ළමයින්ගේ සේවා නියුක්තිය පිළිබඳ පනතේ 2 (1), සාප්පු හා කාර්යාල සේවක පනතේ 10 (2), කර්මාන්තශාලා පිළිබඳ ආඥා පනතේ 67 (b) යනාදීවගන්ති යටතේ වයස අවුරුදු 18ට අඩු ළමයින් රාත්‍රී කාලයේ සේවයේ යෙදවීම තහනම් කර තිබේ. කර්මාන්තශාලා පිළිබඳආඥා පනතේ 68 (1) වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 16ත් 18 ත් අතර අතිකාල සේවයේ යෙදෙන්නන්ගේ සේවා කාලය මාසයකට පැය 50ක් නොඉක්මවිය යුතු වේ. දැනට නීතියේ දක්නට ලැබෙන නෛතික ප්‍රතිපාදන ප්‍රකාරව වයස අවුරුදු 14 න් පසු ළමා ශ්‍රමය නීත්‍යානුකූල වුවත් එකී සේවය අන්තරාදායක නම් වලංගු නොවන බව පෙනේ. කෙසේ වෙතත් ළමයින්ගේ අවම වයස යන නිර්ණායකයට ව්‍යතිරේඛ ලෙස පාසලක සිදු කරන වෘත්තීය හෝ තාක්ෂණික කාර්යන්

MANURAWA 2020

මෙන්ම දරුවන්ගේ සෞඛ්‍යට හෝ සංවර්ධනයට හානි නොවන ආකාරයේ වැඩ හා අධ්‍යාපනයට බාධාවක් නොවන ඒවා අදාළ වේ.ඉහත දැක් වූ සියලු ප්‍රතිපාදන ජාත්‍යන්තර කම්කරු සම්මුතීන් වලට ලංකා නීතියේ අනුගත වීම මනාව පෙන්නුම් කරයි.

## අවදානම් සහගත වෘත්තීන්

2001දී ශ්‍රීලංකාව අපරානුමත කරන ලද ළමා ශ්‍රමය ආශ්‍රිත අවදානම් සහගත ක්‍රියා පිළිබඳවන සම්මුතියේ 1වන ව්‍යවස්ථාව අනුව වයස අවුරුදු 18ට අඩු සියලු පුද්ගලයින්ට අන්තරාදායක ආකාරයේ සේවයන්හි නිරතවීම තහනම් කර තිබේ. එහිදී දරුවන් වහල් සේවයේ යෙදවීම, දරුවන් විකිණීම හා හොරජාවාරමේ යෙදවීම, බලහත්කාරයෙන් සේවයලබාගැනීම, දරුවන් ගණිකා සේවයේ හා අසභ්‍ය දර්ශන නිර්මාණකරණයේ යෙදවීම, මත් ද්‍රව්‍ය ජාවාරම් වැනි නීති විරෝධී කටයුතුවල යෙදවීම මෙන්ම දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා සදාචාරයට හානියක් වන ආකාරයේ සේවයන්හි යෙදවීම තවදුරටත් 3වන ව්‍යවස්ථාව ඔස්සේ තහනම් කර තිබේ. වයස අවුරුදු 18ට අඩු පුද්ගලයින් අන්තරාදායක සේවයේ යෙදවීම තහනම් කිරීම සඳහා කාන්තාවන්ගේ තරුණයින්ගේ හා ළමයින්ගේ සේවා නියුක්තිය පිළිබඳ පනත 2006 දී සංශෝධනයට ලක් විය. (Section 9(1) of EWYPC Act, 1956) එහිදී අන්තරාදායක ලෙස වෘත්තීන් 51ක් හඳුනා ගෙන තිබේ. නමුත් මෙහි ඇති දුර්වලතාවය වන්නේ එම ලැයිස්තුව තුළළමයින් ගෘහාශ්‍රිත සේවයේ යෙදීමේදී සිදු වන අන්තරාදායක සේවයන් අන්තර්ගත නොවීමයි. එබැවින් මෙම පනත නැවත වරක් කාලෝචිතව සංශෝධනය වීම අත්‍යවශ්‍ය කරුණකි.

වයස අවුරුදු 18ට අඩු දරුවන් අන්තරාදායක සේවයේ යෙදවීම හා වහල් සේවය (ද.නී.ස 358A වගන්තිය), බලහත්කාර සේවය ලබාගැනීම (ද.නී.ස 358A වගන්තිය), සන්නද්ධ ගැටුම් තුළ සිදුවන දරුවන්ගේ අනිවාර්ය බඳවාගැනීම් (ද.නී.ස 358A වගන්තිය), ළමා ගණිකා වෘත්තීය (ද.නී.ස 360A, 360 B, 360C, 363වගන්ති), අසභ්‍ය දර්ශන හා ක්‍රියාකාරකම් නිර්මාණය සඳහා දරුවන් යොදවාගැනීම (ද.නී.ස286A වගන්තිය) හා නීති විරෝධී ක්‍රියාවන්හි දරුවන්ව යොදවාගැනීම (ද.නී.ස 288B වගන්තිය), ලංකා නීතිය තුළ තහනම් කිරීමේ අභිමතාර්ථය සහිතව ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය 1995, 1998 හා 2006 යන වසර තුළ සංශෝදනයට ලක් කරනලදී.

ලිංගික ශ්‍රමිකයින් වීම හරහා දරුවන් ලිංගික සම්ප්‍රේෂණ රෝග වලට ගොදුරු විය හැකි අතර අනාගතයේ යහපත් වෘත්තියකට ඇති අවස්ථාද මග හැරේ. එමනිසාගණිකා වෘත්තීය සඳහා කාන්තාවන් හා ළමයින් මිනිස් ජාවාරමේ යෙදවීම වැළක්වීම හා තුරන් කිරීම පිළිබඳ සම්මුතියට අදාළව පනවා ඇති පනත යටතේ යම් පුද්ගලයෙක් දරුවන්ව ගණිකා වෘත්තියේ යෙදවීමේ අරමුණින් යම් ස්ථානයක් පවත්වාගෙන යාම පවා වරදක් බව දක්වා තිබෙනඅතර දරුවන් ලිංගික ශ්‍රමිකයන් ලෙස සේවයේ යෙදවීම නීතිය මගින් තහනම් කර තිබේ.(පනතේ2(1) වගන්තිය) එමෙන්ම මෙම පනත හරහා විදේශ සේවය මුවාවෙන් දරුවන් විදේශ මිනිස් ජාවාරමට හසු වීම් වැළක්වීමට නිසි පියවර ගැනීම වෙනුවෙන් අමාත්‍යවරයාට වගකීමක් ඇති කර තිබේ. (පනතේ12(d) වගන්තිය) 2013 වසරේදී අවුරුදු 17 ක දියණියක් වන රිසානා නෆීක් සෞදි අරාබියේ ගෘහ සේවයේ යෙදෙන අතරතුර මිනීමැරුමක් සම්බන්ධයෙන් මරණ දණ්ඩනය ලැබීම මෑතකාලීනව වාර්තා වූ ඛේදනියම සිද්ධියක් වේ. (bbc.com, 2013)

## සේවා ස්ථානයේ නිසි තත්වයන් පවත්වාගෙන යාම

සේවා නියුක්තිකයින් සඳහා සේවා ස්ථානයේ යෝග්‍ය වටපිටාවක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව සේවකයින් සඳහා නිසි පරිදි විවේක වේලාවන් ලබාදීම වැදගත්වේ. එමෙන්ම ළමා ශ්‍රමිකයන් සඳහා නම්‍යශීලි වේලාවන් සේවය සඳහා ලබාදීම වැදගත්වේ. කාන්තාවන්ගේ තරුණයින්ගේ හා ළමයින්ගේ සේවා නියුක්තිය පිළිබඳ පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව සේවකයින් සඳහා වැඩමුර දෙකක් අතර පැය 13ක ඒකාකාරී විවේකයක්

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

ලබාදිය යුතුවේ. නමුත් අවිධිමත් වෘත්තීන්හි එලෙස විවේක හිමිවේද යන්න ගැටළු සහගතය. එම පනතේම3(4) හා 3(5) යන වගන්ති ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව තරුණ පුද්ගලයන් සඳහා රාත්‍රී7සිට රාත්‍රී11 දක්වා සේවය කිරිමටඅවස්ථාවහිමිවේ. රාත්‍රී කාලයේ සේවයේ යෙදීමේ අවම වයස් සීමාව අවුරුදු 18 වේ. නමුත් පවුලේ ව්‍යාපාර යන්න එහි ව්‍යතිරේඛයක් ලෙස සලකනු ලබයි. මෙහිදී රාත්‍රී කාලය යන්න හවස 6 සිටපසුදා උදේ 6 දක්වා ලෙස නිර්වචනය කර තිබේ. වයස අවුරුදු 16 ත් 18 ත් අතර පුද්ගලයන් සඳහා සාධාරණ හේතු සහිතව රාත්‍රී කාලයේ සේවය කිරීමට අවසර ලබා දීම සඳහා අමාත්‍යවරයාට බලතල තිබේ. ඒඅනුවදවසකට පැය 9ක කාලයක් සඳහා සේවය සීමා කර තිබේ.

දේශීය නීතියේ හඳුන්වා දී ඇති සීමාවන්ට යටත්ව නීත්‍යානුකූලව සේවයේ යෙදෙන ළමයින් සඳහා විශේෂ ආරක්ෂණ විධිවිධාන හඳුන්වා දී තිබේ. ඒ අනුව භයානක යන්ත්‍ර සූත්‍ර ක්‍රියා කරවීම නිසි උපදෙස්, ප්‍රමාණාත්මක පුහුණුව හා දැඩි අධීක්ෂණය යටතේ පමණක්සිදු විය යුතු වේ. එමෙන්ම අවුරුදු 16 ට අඩු කර්මාන්තශාලා ආශ්‍රිත සේවයේ යෙදෙන්නන් සඳහා ශරීර යෝග්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ.පුහුණු වීම් ආශ්‍රිත සේවා නියුක්තිය පිළිබඳ සැළකීමේදීවයස අවුරුදු 14 ට අඩු ළමයින් සඳහා පාසලේ අධ්‍යාපන ආයතනවල හා තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු වීම් වල නියැලිය හැකි වේ. නමුත් එම සේවා නියුක්තිය මහජන අධිකාරියක් මගින් අනුමත කර අධීක්ෂණය කල යුතු වේ. විනෝදාස්වාද ක්‍රියාකාරකම් හා රඟපෑම්, ප්‍රසංග ආදිය සඳහා වෘත්තිමය වශයෙන් ළමයින් භාවිත කිරීම සඳහාද නෛතික සීමාවන් තිබේ. එහිදී ප්‍රේක්ෂකයන්ගෙන් මුදල් අය කරන සෑම විනෝද ප්‍රසංගයක් හෝ ක්‍රියාකාරකමක නියැලීමට හැකි අවම වයස අවුරුදු 14 වේ. සර්කස් වැනි ජීවිතයටඅවදානම්කාරී ඉදිරිපත්කිරීම් සඳහා අවම වයස 18ක් වේ. පාසල් හෝ නාට්‍ය සමාජ කේන්ද්‍ර කරගනිමින සිදු කරන අධ්‍යාපන හා පුණ්‍යාධාර ක්‍රියා මෙම සීමාවන්ට ව්‍යතිරේඛවේ.(Goonasekere,1993)

## පවුල ආශ්‍රිත රැකියා හා ගෘහ සේවය

කෘෂිකාර්මික හා ධීවර කටයුතු ආශ්‍රිත රැකියා සිදුකරන පවුල්වල දරුවන්ද ඒවායේ නිරතවීම බහුලව දක්නට ලැබේ. දරුවාගේ උපරිම යහපත යන සංකල්පය මෙහිදී උල්ලංඝනය වන බව පෙනේ.තම පවුලේම සාමාජිකයන් විසින් පවත්වා ගෙන යනු ලබන සැහැල්ලු කෘෂිකාර්මික හා ගෙවතු වගා කටයුතු වල පාසල් කාලයට පෙර හා පසු නිරතවීමට අවස්ථාව නීතියෙන් ලබාදෙන නමුත් පවුලේ ආර්ථික කටයුතුවලට උදව් වශයෙන් වත් ළමයින්ට ගැඹුරු මුහුදේ ධීවර කටයුතුවල නියැලීම මෙන්ම දුම්කොළ ආශ්‍රිත ක්‍රියා තහනම් කරතිබේ.(Ekanayake, 2018)

1844 වන විට ලංකාව සියලු ආකාරයේ වහල් සේවය නීතියෙන් තහනම් කර තිබේ.( අර්නෝල්ඩ්, 1907) 2006 දී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයට එකතු වූ සංශෝධනය හරහා වහල් සේවය තහනම් කිරීමට අදාළ නෛතික තත්වය තව දුරටත් ශක්තිමත් කරනලදී.(ද.නී.ස. සංශෝධිතපනතේ 358A වගන්තිය, 2006)ඒ අනුව දරුවන් වහල් සේවයේ යෙදවීමද අපරාධමය වගකීමක් ජනිත කරන බව මෙමගින් ව්‍යංගව පැහැදිලි වේ. ඇතැම් අවස්ථාවල වැටුප් වෙනුවට ආහාර හා නවාතැන් පමණක් ලබාදී විවිධ හිංසන, තාඩන පීඩන යටතේ සේවය ලබාගන්නා අතර කිසිදු විවේකයක් නොමැතිව නොනවත්වාම සේවය ලබාගැනීමද දක්නටලැබේ. (Sarvesvaran,2016) මෙවැනි තත්ත්ව වලදී ගෘහස්ථ හිංසනය යටතේ ප්‍රතිකර්ම ලබාගැනී මට නොහැකිවේ. ගෘහස්ථ හිංසනය පිටු දැකීමේ පනතේ 23 වන වගන්තිය යටතේ ගෘහ සේවකයින්ට සිදුවන ගෘහස්ථ හිංසනය හඳුනා ගෙන නොමැති වීම නීතියේ විශාල අඩු පාඩුවක් වේ. එලෙස හඳුනා ගෙන තිබුනා නම් ගෘහ සේවයේ යෙදෙන ළමයින්ට සිදු විය හැකි අමානුෂික වදහිංසා වැළැක්වීම සඳහා අදාළ ප්‍රතිපාදනය මහේස්ත්‍රාත්වරයාට නිර්මාණශීලි ලෙස අර්ථ නිරූපණය කිරීමට තිබුණි. (Sarvesvaran,2016)

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

## යුධමය තත්වවලදී ළමාශ්‍රමය

යුධමය කටයුතු සඳහා සොල්දාදුවන් ලෙස ළමයින් යොදාගැනීම, ළමා ශ්‍රමය භාවිතයේ තවත් ආකාරයක් වේ. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 38(3 ) වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 15ට අඩු ළමයින් යුධ කටයුතු වලට බඳවා නොගත යුතුබව දක්වා තිබේ. වයස අවුරුදු 15ත් 18ත් අතර කෙනෙකු බඳවා ගන්නේ නම් වයස වැඩි අනුපිළිවෙලට එය සිදුකළ යුතුවේ.එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට 2000 වසරේ ගෙන ආ ප්‍රොටොකොලයේ පූර්විකාවේ සන්නද්ධ ගැටුම්වලදී දරුවන් සොල්දාදුවන් ලෙස භාවිතය තහනම්කර තිබේ. එමෙන්ම එහි පළමුවන ව්‍යවස්ථාව දක්වන පරිදි ළමා ගණිකාවන් ලෙස හා අසභ්‍ය නිර්මාණකරණය සඳහා දරුවන් යොදා ගැනීම තහනම් වේ. ජාත්‍යන්තර චාරිත්‍රානුකුල නීතියේ 136 වන රීතියට අනුවද ළමයින් සන්නද්ධ ගැටුම්වල සේවය සඳහා බඳවා ගත නොහැක. 137වන රීතිය යටතේ සන්නද්ධ ගැටුම් පවතින අවස්ථාවල දරුවන් ඔත්තුකරුවන්, මුරකරුවන් හා ලියුම් හුවමාරු කරන්නන් ලෙස සේවයේ යෙදවීම තහනම් කර තිබේ. ජිනීවා සම්මුති වලට අදාළ පළමුවන අතිරේක සන්ධානයේ 77(2) ව්‍යවස්ථාව අනුව අන්තර් ජාතික සන්නද්ධ ගැටුම් වලදී ළමයින් සොල්දාදුවන් ලෙස බඳවා නොගතයුතු බව දක් වාතිබේ. 182 වන සම්මුතිය යටතේද වයස අවුරුදු 18ට අඩු දරුවන් යුධ කටයුතු සඳහා යොදා ගැනීම තහනම් වේ.

ශ්‍රී ලංකාව ඉහත සම්මුති අපරානුමත කර ඇති නිසා වසර30ක් පැවති සිවිල් යුද්ධය තුළ ළමා ශ්‍රමය භාවිතය තහනම් විය. නමුත් ත්‍රස්තවාදීන් ළමයින්ට අවිපුහුණුව ලබාදීම හා සොල්දාදුවන් ලෙස භාවිත කිරීම බහුලව දක්නට ලැබිණි. 2008 – 2009 කාලවකවානුව තුළ උතුරු නැගෙනහිර ළමයින්ගෙන් 90% ක් යුධ සෙබළුන් ලෙස සේවයේ නිරතවිය. (Ekanayake,2018) එමනිසා ඔවුන් යුධ සමයේ දී ප්‍රමාණවත් අධ්‍යාපනයක් නොලැබූ අතර එහි ප්‍රතිඵල ලෙස මේවන විට දැඩි දුෂ්කරතා වලට මුහුණපා සිටී.

## ප්‍රායෝගික යාන්ත්‍රණය

ලංකාවේ ප්‍රායෝගික තත්වය තුළ කම්කරු නිළධාරීන්ට ළමා ශ්‍රමිකයින් හා සම්බන්ධ නීති කඩ කරන්නන්ට එරෙහිව නඩු ගොනු කිරීමට බලය හිමි වේ. ළමා ශ්‍රමිකයින් සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවට යම් පැමිණිල්ලක් ලැබුණු විට කම්කරු නිළධාරියෙකු, පොලිස් නිළධාරියෙකු හා පරිවාස නිළධාරියෙකුගෙන් සමන්විත සෝදිසි කණ්ඩායමක් පිටත් කරනු ලබයි.(Ekanayake,2018) පොලිස් නිළධාරීන්ට අදාළ සිද්ධිය සම්බන්ධයෙන් පියවර ගැනීමට හෝ විමර්ශනය කිරීමට කිසිඳු අධිකාරී බලයක් හිමි නොවේ. ඒසඳහාඅපරාධ නඩු විධාන සංග්‍රහයේ 122 (2) වගන්තිය ප්‍රකාරව පොලිසිය විසින් පළමුව අධිකරණයෙන් හෝ භාරකරුවන්ගෙන් අවසර ලබා ගත යුතු වේ. මෙම ක්‍රියාවලි තරමක් ප්‍රමාදකාරී විය හැකි අවස්ථා වලදී ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අපේක්ෂිත ප්‍රතිඵලයට ලඟා විය නොහැකි අවස්ථාද පවතී. මෙහිදී පරිවාස නිළධාරියාගේ වගකීම විය යුත්තේ අදාළ දරුවාට ආරක්ෂාව සපයමින් ඔහුව වඩාත් සුරක්ෂිත ස්ථානයකට රැගෙන යාමයි.මෙම ක්‍රියාවලියේ සාර්ථකත්වය උදෙසා මෙකී ආයතන හා නිළධාරීන් අන්‍යෝන්‍යාවමනා අවබෝධයෙන් ක්‍රියා කිරීම වැදගත් වේ.(Goonasekere,1993)

යම් ළමයෙක් ළමා ශ්‍රමිකයෙකු ලෙස දැඩි කෘරත්වයට හාඅමානුෂිකසැළකීමකටමුහුණ දෙන්නේ නම් ඒ සඳහා ගත හැකි නෛතික ප්‍රතිපාදනයක් නීතියේ වෙනමම අන්තර්ගත නොවේ. පොලිස් නිළධාරීන්ට හැකියාව ඇත්තේ දණ්ඩ නීති සංග්‍රහයේ 314, 315 හා 316 යටතේ වන බරපතල හිරිහැරය යටතේ නීතිය ක්‍රියාත්මක කිරීම පමණි. නමුත් එයටපිළිතුරක්ලෙස1995 දී දණ්ඩ නීති සංග්‍රහයට එකතු කරන ලද සංශෝධනයේ වගන්ති හරහා සාධනීය උත්සාහයක් ගෙන තිබේ. කාන්තාවන්ගේ තරුණයින්ගේ හා ළමයින්ගේ සේවා නියුක්තිය පිළිබඳ පනතේ 2

©All rights reserved

සිට 12 වන වගන්ති දක්වා ශ්‍රී ලංකාවේ ළමා උසාවි පද්ධතියක් ස්ථාපනය කිරීමට අදාළ නෛතික ප්‍රතිපාදන අන්තර් ගත කර තිබේ. නමුත් අද වන විට ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන්නේ බම්බලපිටියේ පිහිටි ළමා අධිකරණය පමණකි.(Ekanayake,2018) ප්‍රායෝගික තත්වය තුළ ළමයින්ගෙන් නිවැරදි සාක්ෂි ලබා ගැනීම තරමක් අපහසු කර්තව්‍යක් වන අතර ඇතැම් අවස්ථා වලදී සේවා ස්ථානයේ ස්වාමියා විසින් ළමයින්ව සාක්ෂි ලබා නොදෙන ලෙස නොමග යැවීම හෝ තර්ජනය කිරීම ආදිය සිදු කළ හැකි වේ. ලංකාවේ ළමා ශ්‍රමිකයන් සම්බන්ධ නීති තත්වය මෙන්ම ළමා අයිතිවාසිකම් පිළිබඳ අවබෝධය හා දැනුවත්බව මදි කමක් ලාංකීය සමාජය තුළ දක්නට ලැබේ. මේනිසා බොහොමයක් සිද්ධීන් වාර්තා නොවන බව පෙනේ. එමෙන්ම මෙවැනි සිද්ධි වලදී භාරකාර පාර්ශවයන් ගෙන් ඉටුවිය යුතු වගකීම් හා සහයෝගය ලබාදීම නිසි පරිදි ඉටුවන්නේද යන්න සැක සහිතය.

## නිගමනය

ඉහත කරුණු අනුව ළමා ශ්‍රමය හා අදාළ වන ශ්‍රී ලංකාවේ නෛතික තත්වයතුළසාධනීය මෙන්ම නිශේධනීය ලක්ෂණද හඳුනා ගත හැකිය. ජාත්‍යන්තර කම්කරු මූලධර්ම හා ප්‍රතිපත්ති සියල්ලකටම පාහේ අනුගත වී දේශීය නීතියට ඒවා අදාළ කර ගැනීමටඋත්සාහ කරතිබීම සාධනීයවේ. නමුත් එම නීති ක්‍රියාත්මක වන යාන්ත්‍රණයේ පවතින අඩුපාඩු, ප්‍රායෝගික දුෂ්කරතා හා ඇතැම් නීතියල් පැන ගොස්තිබීම ආදිය නිසා නීතියේ හිස්තැන් නිර්මාණයවන බව හඳුනා ගැනීමට මෙහිදී උත්සාහ කර තිබේ. විශේෂයෙන්ම ළමාශ්‍රමයනිසා ළමා කාලය තුළ ළමයින්ටහිමි විය යුතු අයිතිවාසිකම් බාධාවට ලක් වන අතරම අනාගත යහපත් සංවර්ධනයට තිබිය යුතු පදනම නිසි පරිදි නොලැබී ඉඩකඩ ඇහිරී යයි. එමනිසා සියලු අයිතීන් තුලනාත්මකව බලාත්මකවන පරිදි නීති තවදුරටත් ශක්තිමත් කිරීම ඉතා වැදගත්වන බව පෙනේ. ළමා ශ්‍රමිකයින් හා සම්බන්ධ බොහෝ දත්ත වෙනත්රටවලට සාපේක්ෂව ලංකාවේ අඩු අගයක් ගත්තද බොහෝමයක් සිද්ධීන් වාර්තා නොවන බව මතක තබා ගත යුතු කරුණකි.

සේවය කිරීමට අදාළ කොන්දේසි මාලාවක් හා තත්වයන් ඉදිරිපත් කිරීම, අයිතීන් බලාත්මක කිරීමට යාන්ත්‍රණයක් සැකසීම හා ඒවා කඩ කරන්නන්ට දඬුවම් කිරීමේ නිසි ක්‍රමවේදයක් සැකසීම රාජ්‍ය වගකීම වේ.ලංකාවේ වසර තිහකට අධිකව පැවති සිවිල් යුධ වාතාවරණය, සුනාමි වැනි දරුණු ගණයේ ස්වාභාවික ආපදා, අපරාධ රැළි නිසා සිදු වූ සමාජ පිරිහීම් හේතුවෙන්පහු ගිය දශක කිහිපය තුළ ඇති වූ ලංකාවේ ආර්ථික කඩාවැටීම්හා සමාජ හා ආර්ථික ප්‍රගමනය තුළ සිදු වූ වෙනස්කම් ලංකාවේළමාශ්‍රමය පිළිබඳ තත්වයට බලපෑ බව හඳුනාගත හැක. වර්තමානයේ උද්ගතව ඇති ගෝලීය කොරෝනා වසංගත තත්වය නිසා ඇති වන ආර්ථික පසු බැසීම් හමුවේ ලංකාවේ පමණක් නොව ගෝලීය වශයෙන් ළමා ශ්‍රමිකයින් ප්‍රමාණාත්මකව ඉහළ යාමේ අවදානමක් පවතී.

2003 අංක 8 දරණ කාන්තාවන්ගේ තරුණයින්ගේ හා ළමයින්ගේ සේවා නියුක්තිය පිළිබඳ සංශෝධන පනත හරහාහඳුන්වා දී තිබෙන දඬුවම්වලටඅනුව අවම වයස උල්ලංඝනය කළහොත් රුපියල් දස දහසක දඩයක් හෝ මාස 12ක සිරගත කිරීමකට යටත් වේ. නමුත් අද වනවිට මෙම දඬුවම් කාලෝචිතව ප්‍රමාණාත්මකද යන ගැටලුව පැනනගී. එමනිසා බොහොමයක් පනත්වල දඬුවම් කාලෝචිතව සංශෝධනය කිරීම අවශ්‍යතාවයක්වී තිබේ. ළමා ගෘහ සේවකයින් ආවරණය වන පරිදි කිසිඳු නෛතික ප්‍රතිපාදනයක් අන්තර්ගත නොවීමද දුර්වලතාවයක් වේ. අනිවාර්ය අධ්‍යාපනයට ඇති අවම වයස්සීමාව හා ළමා ශ්‍රමයට අදාළ වයස් සීමාව එකිනෙක ගැටීම නීතිය මගින් ආමන්ත්‍රණය කළයුතු නීතියේ තවත් හිස්තැනකි. වර්තමානයේ තාක්ෂණික දියුණුව හමුවේ බොහොමයක් ළමයින් අන්තර්ජාල ආශ්‍රිත රැකියාවලට යොමුවීමේ සැළකිය යුතු ප්‍රවණතාවයක් දක්නට ලැබේ. විශේෂයෙන්ම අඩු වයසින්ම අන්තර්ජාල ආශ්‍රිත මුදල්ඉපයීම්, යූ ටියුබ් වැනි සමාජ ජාල හරහා කරන නිර්මාණ

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

ඔස්සේ මුදල් ඉපයීම් ආදී නව වෘත්තින්ද අද වන විට ඉස්මතුව තිබේ.එවැනි දේ හරහා ළමයෙකුට සිදුවිය හැකි අහිතකර බලපෑම් අතිවිශාලය. එමනිසා මෙම ක්ෂේත්‍රද අනාගතයේදී නීතිය හරහා ආමන්ත්‍රණය කළ යුතු පැතිකඩ ලෙස හඳුනාගත හැකිය.ඉහත දක්වා ඇති නීතියේ අඩුපාඩු සකස්කර පවතින නීතිය තවදුරටත් ශක්තිමත් කිරීම හා ළමා ශ්‍රමය පිළිබඳ සමාජ දැනුවත්භාවය වැඩි කරමින් ලංකාවේ ළමා ශ්‍රමය ආශ්‍රිත නීතියේ ප්‍රගමනයට සාධනීය ප්‍රවේශයක් ගත හැකිවේ.

### References

## Books


Department of census and statistics Ministry of National Policies and Economic Affairs,(2016), '*Child activity survey Final Report*' [online] Available at: www.statistics.gov.lk, (Accessed: 07 May 2020)

Center for security studies, (2002), '*Guide book on the rights of the child in Sri Lanka*', IDLO, [online] Available at:

https://css.ethz.ch/en/services/digital-library/publications/publication.html/138663 (Accessed: 07 May 2020)


### Journal Articles


Ekanayake,E.M.Y.G.'*Profile of child labour in Sri Lanka*', International Jounal of Business,Economics and Law, vol 17 , P.23 – P.28

Goonasekere S.W.E,(1993)'*Child labour in sri lanka learning from the past*',p. 46

Sarvesvaran.A (2016), '*Review of the existing legal Instruments on child labour in domestic workers in Sri Lanka*', ILO Country office for Sri Lanka and Maldives, p.21

Sarvesvaran.A(2010), '*An evaluation of Sri Lankan Labour Law Standards in the light of the core conventions of the International Labour Organization.*'[Online]. Available at: http://hdl.handle.net/70130/178 (Accessed: 8 may 2020)


## International conventions


ILO Minimum Age for Employement Convention (No.138), 1973

ILO Worst Forms of Child Labour Convention (No. 182), 2000

International Convention on Economic, Social and Cultural Rights, 1966

International Covenant on Civil and Political Rights, 1966

The Universal Declaration of Human Rights, 1948

United Nations Convention on the Rights of the Child on the Rights of the Child, 1989


### Legislations


Criminal Procedure Code, No. 15 of 1979

Employment of Children Regulations, 1958

Employment of Women, Young Person and Children Act No.47 Of 1956

Factories Ordinance No. 45 Of 1942

Penal Code Amendment Act No.22 Of 1995

Prevention of Domestic Violence Act 2005

Regulation of Compulsory Education 2016

Shop and Office Employees Act No. 19 Of 1954

Sri Lanka Bureau of Foreign Employment Act No. 21 Of 1985

The Constitution of Sri Lanka, 1978


MANURAWA 2020

©All rights reserved

The Education Ordinance No. 31 Of 1939

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv